**වේලනෙයි ප්‍රාදේශීය සභාව - 2024**
**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වේලනෙයි ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට වේලනෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන ව්‍යාපෘති 02 ක එකතු වටිනාකම රු.9,426,126 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට පියවර ගෙන ඇති බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන සභායක අරමුදලෙන් සභාවට ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන රු.45,282,297 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි පිළියෙල කළ යුතුය. |
| (ඇ) | වැඩ අවසන් නොකළ ඉදිකිරීම් කාර්යයන් 03 ක් සහ භාණ්ඩ ලැබී නොතිබුණු මිලදී ගැනීම් 04 කට අදාල එකතුව රු.6,240,275 ක ඇස්තමේන්තුගත පිරිවැය ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදුකළ යුතුය. |
| (ඈ) | සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 15ක වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ රු. 4,450,016 ක් වැය කර ඉදිකළ කුරිකට්ටුවාන් වැසිකිළි පද්ධතියේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරියේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2021 ජූලි 08 දිනැති අංක 2235/54 අතිවිශේෂ ගැසට් පත්‍රයේ I කොටසෙහි 11 වගන්තිය | අනුකූලතා සහතික ලබානොගත් ගොඩනැගිලිවලට කාලය දීර්ඝ කිරීමේ ගාස්තු රු.820,000 ක් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කාලය දීර්ඝ කිරීමේ ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,841,594 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,444,791ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 714,300 | 1,223,790 | 1,223,790 | - | 3,871,000 | 3,945,460 | 3,945,460 | - |
| කුලී | 1,073,000 | 1,056,200 | 1,033,850 | 22,350 | 584,500 | 894,500 | 854,600 | 39,900 |
| බලපත්‍ර ගාස්තු | 763,000 | 1,367,427 | 1,367,427 | - | 501,800 | 1,293,389 | 1,293,389 | - |
| වෙනත් ආදායම් | 12,257,700 | 9,020,283 | 9,020,283 | - | 4,199,700 | 7,519,298 | 7,519,298 | - |
| එකතුව | 14,808,000 | 12,667,700 | 12,645,350 | 22,350 | 9,157,000 | 13,652,647 | 13,612,747 | 39,900 |

**2.2.2** ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජූලි 12 දිනැති අංක 2132 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව, සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම සේවක කොට්ඨාශ 30ක් සංවර්ධිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර තිබූ නමුත්, එම ප්‍රදේශවල දේපළ බදු තක්සේරුවට යටත් කර වරිපනම් බදු අය කිරීමට පියවර ගෙන නොතිබුණි. | දේපළ බදු තක්සේරු කිරීම් සිදු කරනු ලබන බව. | දේපළ බදු තක්සේරුවට යටත් කර වරිපනම් බදු අය කිරීමට පියවර ගත යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ** අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුවල පවතින රු. 45,758,239 ක ශේෂය උපයෝගි කර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ IV පරිච්ඡේදයේ 108 වගන්තියේ සඳහන් පොදු උපයෝගීතා සේවාවන්ට අදාල සංවර්ධන ක්‍රියාකාරකම්වල නොයොදවා බැංකුවේ පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් සභාව විසින් තැන්පත් කර තිබුණි. | සංවර්ධන සැලැසුම් තීරණය කරන තෙක් තැන්පත් කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව, පොදු උපයෝගීතා සේවාවන් සංවර්ධනය කිරීමට පියවර ගත යුතුය. |
| ( ආ) | සභාව විසින් වාර්ෂිකව ලංසු කැඳවා පිරිනමනු ලබන වෙළෙඳපොලවල් සහ කඩ කාමර එකතුව 18 ක් ලංසු කැඳවා පිරිනැමීමට කටයුතු නොකිරීමෙන් සභාවට රු.1,792,010ක ආදායම් අහිමි වි තිබුණි. | සභාව විසින් ලංසු කැඳවා තිබූ නමුත් කිසිවෙකුත් ලබාගැනීමට ඉදිරිපත් නොවූ බව. | ආදායම් මූලාශ්‍ර ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාමට පියවර ගත යුතුය. |
| ( ඇ) | 2023 වර්ෂය තුළ සභාවේ සංවර්ධන සංචිත අරමුදලින් සිදු කිරීමට සැලසුම් කර තිබූ රු.600,000කට ඇස්තමේන්තු කර තිබූ සංවර්ධන කාර්යයන් 02 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | වැලි හිඟය හේතුවෙන් එම කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | නියමිත වර්ෂය තුළ අවසන් කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | 1915 අංක 15 දරන නිවාස ඉදිකිරීම් හා නාගරික සංවර්ධන ආඥා පනතේ 15(1) වගන්තිය ප්‍රකාරව; පනතේ විධිවිධානවලට අනුකූලව ගොඩනැගිලි ඉදිකර තිබේද යන්න තහවුරු කර අනුකූලතා සහතිකය (COC) නිකුත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගොඩනැගිලි ඉදිකිරීමට ලබාදුන් සංවර්ධන බලපත්‍ර 163ක් සඳහා අනුකූලතා සහතික ලබාදී නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | අනුකූලතා සහතිකය ලබාදීමට පියවර ගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් වර්ෂ 01 සිට 13කට අධික කාලයක් භාවිතා කළ නොහැකි තත්ත්වයේ පැවැති වාහන 22ක් අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට පියවර ගෙන නොතිබුණි. | අළුත්වැඩියා කිරීමට/ අපහරණය කිරීමට කටයුතු කරමින් පවතින බව. | අලුත්වැඩියා කිරීමේ හෝ අපහරණය කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | සභාව විසින් පරිහරණය කරනු ලබන සුසාන භූමි 13ක්, ඉඩම් 09ක්, ළිං 02ක් සහ වාහන21ක හිමිකාරිත්වය සභාවට පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | සභාවට අයිතිය පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | වත්කම්වල අයිතිය නිරවුල් කරගෙන පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරීන් 03 දෙනෙකුගෙන් රු. 432,946 ක ආපදා ණය වර්ෂ 01 සිට 03ක් දක්වා කාලයක් සඳහා අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ණය අයකර ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ප්‍රකාරව ඇස්තමේන්තුගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේදි ආදායම් විෂයන් 05ක සියයට 11 සිට සියයට 79ක් දක්වාත්, වැය විෂයන් 05ක සියයට 11ක සිට සියයට 42ක් දක්වාත් මූලධන වැය විෂයක සියයට 31ක විචලනයක්ද පැවැතිම හේතුවෙන් අයවැය, ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | සටහන් කරගත් බව. | අවශ්‍යතා හඳුනාගෙන සැලැකිලිමත් ලෙස අයවැය සකස් කළයුතු අතර එය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය. |